## 2017 වර්ෂයේ ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වනු ලබන දින දර්ශනය මහකනදරාව ව්‍යාපාරය

| මාසය | පවත්වනු ලබන දිනය |
|---|---|
| ජනවාරි | 05 |
| පෙබරවාරි | 02 |
| මාර්තු | 02 |
| අප්‍රේල් | 06 |
| මැයි | 04 |
| ජුනි | 01 |
| ජූලි | 06 |
| අගෝස්තු | 03 |
| සැප්තැම්බර් | 07 |
| ඔක්තෝබර් | 12 |
| නොවැම්බර් | 02 |
| දෙසැම්බර් | 07 |

මගේ අංකය : 16/03/02
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
මහකනදරාව ව්‍යාපාරය
රඹෑව.
**2016.08.11**
ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ සියළුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

## ව්‍යාපාර කළමණාකරණ කමිටු රැස්වීම් වාර්තාව 2016 අගෝස්තු මාසය මහකනදරාව ව්‍යාපාරය

දිනය - 2016/08/04
වේලාව - පෙ.ව. 9.30
ස්ථානය - මහකනදරාව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාව

සහභාගි වූ රජයේ නිලධාරින්

| අනු අංක | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 01 | අයි.ඩී.එන්.අයි.පතිරණ මිය | නේවාසික ව්‍යාපාරකළමනාකරු | මහකනදරාව ව්‍යාපාරය |
| 02 | පී.යු.කේ. තිලකරත්න මයා | ප්‍රදේශිය වාරිමාර්ග ඉංජිනේරු | වාරි. ඉංජිනේරු කාර්යාලය - අනුරාධපුර |
| 03 | බී.ටී. මහආරච්චි මයා | ඉංජිනේරු සහකාර | වාරි. ඉංජිනේරු කාර්යාලය, අනුරාධපුර |
| 05 | ඩබ්.පී.කේ.එස්.එම්.ලීලාරත්න මයා | ඉංජිනේරු සහකාර | වාරි. ඉංජිනේරු කාර්යාලය, අනුරාධපුර |
| 04 | යූ.එච්.ආර්.ජී. වසන්ත කුමාර මයා | ගොවිජන සංවර්ධන නිලධාරි | ගොවිජන සේවා මධ්‍යස්ථානය -රඹෑව |
| 06 | ඒ.ජී.එස්.සුභාෂණී මිය | මුලස්ථාන කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - රඹෑව |
| 07 | ජී.කේ.එම්.යූ.එස්.කේ. කවිරාජ් මයා | ජනපද නිලධාරි | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - රඹෑව |
| 08 | යූ.ජී.ඒ.එස්.ආරියරත්න මයා | සංවර්ධන නිළධාරි | මහකනදරාව ව්‍යාපාරය |
| 09 | බී.එම්.පී.රණතුංග මයා | සංවර්ධන නිළධාරි | මහකනදරාව ව්‍යාපාරය |
| 10 | ඒ.ඒ.යූ.එස්.එන්.හේවාගමගේ මිය | සංවර්ධන නිලධාරි | ගොවිජන සේවා මධ්‍යස්ථානය - කල්ලංචිය |

සහභාගි වූ ආරාධිතයන්

| අනු අංක | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 01 | එච්.ජේ.එම්.ජේ. හේරත් මයා | අඩවි වන නිලධාරි | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව - අනුරාධපුර |
| 02 | ඒ.ආර්.එන්. රත්නවීර මයා | අඩවි වන නිලධාරි | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව - මැදවච්චිය |
| 03 | කේ.පී.බී.එස්. රත්නසේකර මයා | නියෝජ්‍ය ප්‍රාදේශීය කළමනාකරු | රාජ්‍ය දැව සංස්ථාව - අනුරාධපුර |
| 04 | ආර්.ඩී.අයි. රුවන් කුමාර මයා | බීට්ටු වන නිලධාරි | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව - රඹෑව |

සහභාගි වූ ගොවි නියෝජිතයන්

| අනු අංක | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 01 | ආර්. එම්. ආර්. රාජපක්ෂ මයා | ගරු සභාපති | ව.ඉ. සුභද ගොවි සංවිධානය |
| 02 | ඩබ්.එන්.පී. විමල් රත්නසිරි මයා | ගරු භාණ්ඩාගාරික | ද.ඉ. සුභද ගොවි සංවිධානය |
| 03 | ඩී.බී.දිසානායක මයා | ගරු සභාපති | ද.ඉ.රණමයුර ගොවි සංවිධානය |
| 04 | එම්.ප්‍රේමරත්න මයා | ගරු සභාපති | ද.ඉ පැරකුම් යාය 05 ගොවි සංවිධානය |
| 05 | එස්.ඩී. සුනිල් මයා | ගරු ලේකම් | ද.ඉ. පැරකුම් යාය 05 ගොවි සංවිධානය |
| 06 | සී.එම්.එම්.ජයසේන මයා | ගරු සභාපති | ද.ඉ. වේළුසුමන ගොවි සංවිධානය |
| 07 | සමන් අබේධීර මයා | ගරු භාණ්ඩාගාරික | ද.ඉ. පැරකුම් යාය 02 ගොවි සංවිධානය |
| 08 | සී.ඒ.තිලකරත්න මයා | ගරු ලේකම් | ව.ඉ.සුභද ගොවි සංවිධානය |
| 09 | එම්.දයාවතී මිය | ගරු සභාපති | ව.ඉ එක්සිත් ගොවි සංවිධානය |
| 10 | දීපානි සුභසිංහ මිය | ගරු භාණ්ඩාගාරික | ද.ඉ. රණමුයර ගොවි සංවිධානය |
| 11 | එස්.එම්.කේ.බී. සමරකෝන් | ගරු භාණ්ඩාගාරික | ව.ඉ. මිහිදු ගොවි සංවිධානය |
| 12 | එස්. එම්. විමල් සමරනායක මයා | ගරු සභාපති | ව.ඉ. මහසෙන් ගොවි සංවිධානය |
| 13 | සුභසිංහ රත්නායක මයා | ගරු සභාපති | ව.ඉ. රණමයුර ගොවි සංවිධානය |
| 14 | පී.ගුණසිරි මයා | ගරු සභාපති | ව.ඉ.එකමුතු ගොවි සංවිධානය |
| 15 | යසපාල සෙනවිරත්න මයා | ගරු ලේකම් | ද.ඉ. සමගි ගොවි සංවිධානය |
| 16 | ආර්.පී. ආනන්ද රාජපක්ෂ මයා | ගරු සභාපති | ද.ඉ. සමගි ගොවි සංවිධානය |
| 17 | යූ.ජී. චමින්ද හේමන් මයා | ගරු ලේකම් | ද.ඉ. සුභද ගොවි සංවිධානය |

| | | | |
|---|---|---|---|
| 18 | එම්.සී.එම්. නවාහිර් මයා | ගරු සභාපති | ද.ඉ. ෂම් ෂම් ගොවි සංවිධානය |
| 19 | ඒ.එම්.එන්. මීරාන් මයා | ගරු ලේකම් | ද.ඉ.ෂම් ෂම් ගොවි සංවිධානය |
| 20 | කේ.එස්.සමන් තිලක්කුමාර මයා | ගරු සභාපති | ද.ඉ. මහසෙන් ගොවි සංවිධානය |
| 21 | ඩබ්.බී.වසන්ත ජයසේන මයා | ගරු ලේකම් | ද.ඉ.පැරකුම් යාය 02 ගොවි සංවිධානය |
| 22 | අයි.එම්.ජයතිස්ස මයා | ගරු සභාපති | ද.ඉ.සුභද ගොවි සංවිධානය |

ආගම සිහි කිරිමෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමිය විසින් පැමිණ සිටි සියලු දෙනා පිළිගත් අතර
රැස්වීමේ න්‍යාය පත්‍රය සභාගත කරන ලදී.

**01. පසුගිය රැස්වීම් වාර්තාව සමාලෝචනය හා එකඟතාවය ලබා ගැනීම.**

පසුගිය රැස්වීම් වාර්තාවේ අනු අංක 6.2 යටතේ සඳහන් වූ "කාබනික පොහොර සඳහා සත්ත්ව පොහොර භාවිතා කරන ක්‍රමවේදය" යන්න ප්‍රදේශයේ සත්ත්ව පොහොර හිඟ බැවින් කාබනික පොහොර සඳහා සත්ත්ව පොහොර අත්‍යාවශ්‍යද යන්න හා භාවිතා කරන ක්‍රමවේදය කුමක්ද යන්න ලෙස නිවැරදි විය යුතු බව දකුණු ඉවුර පැරකුම් යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපති මහතා පෙන්වා දුන් අතර අනු අංක 04 යටතේ සඳහන් වූ "ප්‍රතිලාභීන් 100% ම වැඩබිම් වලට සහභාගි නොවන බැවින් ඔවුන් සඳහා වෙන්කර ඇති ශ්‍රමදින වැටුප් මුදල් මහකනදරාව ව්‍යාපාරයේ අපවහන ඇල මාර්ග වෙන්කර ගැනීමට මිනුම් කටයුතු සඳහා ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස"යන්නට අපවහන ඇල මාර්ග හා කුඹුරු ඉඩම් වෙන් කර ගැනීම යන්න ඇතුලත් විය යුතු බව ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති මහතා පෙන්වා දෙන ලදී. එම සංශෝධනයන්ට යටත්ව පසුගිය රැස්වීම් වාර්තාව දකුණු ඉවුර පැරකුම් යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපති මහතාගේ හා දකුණු ඉවුර රණමයුර ගොවි සංවිධානයේ ගරු සභාපති මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

**02. ලිපි ඉදිරිපත් කිරිම.**

| අනු අංක | නිකුත් කළ අය /ආයතනය | කාරණය | වෙනත් |
|---|---|---|---|
| 2.1 | ද.ඉ. ෂම් ෂම් ගොවි සංවිධානය | ඉකිරිගොල්ලෑව කුඩා වැවෙහි වාන් ඇල රොන්මඩ ඉවත් කර ගැනීම | අවශ්‍ය යන්ත්‍ර ලබා දීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව එකඟතාවය පළකරන ලදී. |
| 2.2 | ව.ඉ. එක්සත් ගොවි සංවිධානය | යාය 06 ජනපදයේ කුඹුරු විස්සක් සඳහා කුඹුරු බට ලබා ගැනීම<br>OT 25 G- 01 G- 03 කෙත් ඇලවල් සඳහා දොරවල් දෙකක් සවි කරවා ගැනීම<br>වාරිමාර්ග ප්‍රධාන ඇල OT 27 ඇලේ මුල කොන්ක්‍රීට් බැම්ම සකස් කර ගැනීම<br>OT 26 කෙත් ඇලේ අවසන් කුඹුරට ජලය ගැනීමට අපවහන ඇලට බෝක්කුවක් සවි කිරීම<br>OT 25 G1 ඇලේ ඇල බැම්ම පිළිසකර කර ගැනීම<br>OT 25 G1 හා OT 25 G2 ඇලේ | ක්ෂේත්‍ර පරික්ෂාවකින් හඳුනා ගැනීමෙන් අනතුරුව ජීවන සහන වැඩසටහන යටතේ කළ හැකි වැඩ කොටස් කිරීමට එකඟතාවය ලබා දීමට තීරණය විය. |

| | | | |
|---|---|---|---|
| | | කෘෂි පාර සකස් කර ගැනීම | |

**03.** ආයතන සංවර්ධන කටයුතු :- සංවර්ධන නිලධාරි යූ.ජී.ඒ.එස්. ආරියරත්න මයා

**3.1** **2016** ජූලි මස ප්‍රගතිය

| අනු අංකය | කාරණය | ප්‍රගතිය | වෙනත් |
|---|---|---|---|
| **3.1.1** | කාරක සභා රැස්වීම් පැවැත්වීම | **12** | ද.ඉ. මහසෙන්/ ද.ඉ. වේළුසුමන/ව.ඉ.රඹෑවගම හැර අනෙකුත් ගොවි සංවිධාන රැස්වීම් පවත්වා ඇත. |
| **3.1.2** | මාසික මුදල් සාරංශ කාර්යාලයට ලබා ගැනීම **(2016/8/4** දිනට**)** | **04** | ද.ඉ.රණමයුර/ද.ඉ. සමගි/ ව.ඉ. මිහිඳු /ව.ඉ. රණමයුර ගොවි සංවිධාන ලබා දී ඇත |

**3.2** ද.ඉ. වේළුසුමන ගොවි සංවිධානයේ නිල කාලය **2016/07/16** දිනෙන් අවසන් බැවින් ජීවන සහන වැඩ සටහනට බාධාවක් නොවන පරිදි නිලවරණ මහා සභා රැස්වීම පැවැත්වීමට කටයුතු කළ යුතු බවත්

**3.3** පුහුණු වැඩ සටහන් පැවැත්වීම.

තණකොළ කපන යන්ත්‍ර නඩත්තුව හා අළුත්වැඩියාව පිළිබඳ පුහුණු වැඩසටහන **2016/08/16** දින පෙ.ව. **9.00**ට රඹෑව යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලයේදී පැවැත්වීමට නියමිත බවත්

**3.4** පරිසර වැඩ සටහන

පාවිච්චි කිරීමෙන් අනතුරුව පරිසරයට මුදා හරින විවිධ වර්ගයට අයත් බැටරි,පරිගණක හා විද්‍යුත් උපකරණ කොටස්, රසායනික ද්‍රව්‍ය බහාලුම් (බෝතල්) නිසි පරිදි විනාශ කිරීමේ වැඩ සටහනක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත බවත් දැනුම් දෙන ලදී.

**3.5** ජීවන සහන වැඩසටහන

ජීවන සහන වැඩසටහන යටතේ වාරිමාර්ග ඇල පද්ධතියට හා ජලය ගෙන යාමට බාධාවක්ව පවතින ගස් ඉවත් කිරීම සම්බන්ධව කටයුතු කිරීමේදී **2016/07/12** දින රඹෑව ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු රැස්වීමේදී මැදවච්චිය බීට්ටු වන නිලධාරි මහතා විසින් **"**නීතිමය වශයෙන් බලය පැවරුණු ලියවිල්ලක් අතේ නොමැතිව ගොවි සංවිධාන විසින් කිසිදු ගසක් නොකැපිය යුතුය.**"** යනුවෙන් කරන ලද ප්‍රකාශයට අනුව **2016/7/13** දින වාරිමාර්ග දෙපාර්තමේන්තුව/ වාරිමාර්ග කළමනාකරණ අංශය/ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව/අදාල සියළුම ග්‍රාමනිලධාරින් හා සියළුම ගොවි සංවිධාන නිලධාරින්ගෙන් යුක්ත වූ කමිටුව විසින් සාකච්ඡා කර සකස් කර ගත් කාලසටහන අනුව සියළුම ගොවි සංවිධාන වල ඉවත් කළ යුතු ගස් ලේඛන මේ වන විට හඳුනාගෙන ඇති ඇති අතර ව.ඉ. **OT9**, ද.ඉ. **OT 23 8.5** සහ ද.ඉ. **OT14** ඇලේ කොටසක් (කැලය ශුද්ධ නොකළ කොටස) පමණක් ඉතිරිව පවතින බවත් ඉදිරි දින කීහිපය තුල එම ඇල මාර්ගවලද ඉවත් කළ යුතු ගස් හඳුනාගැනීමට සැලසුම් කර ඇති බවත් ජීවන සහන වැඩසටහනේ දැනට ඉතිරිව ඇත්තේ ශ්‍රම දින **20** ක් පමණක් බැවින් ඉවත් කළ යුතු ගස් ඉවත් කිරීමට කඩිනම් වැඩසටහනක් අවශ්‍ය බවත් ඒ සඳහා අද දින සාකච්ඡා කර

සුදුසු ක්‍රමවේදයක් තීරණය කළයුතු බැවින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුරාධපුර හා මැදවච්චිය අඩවි වන නිලධාරින් සහ දැව සංස්ථාවේ අනුරාධපුර නියෝජ්‍ය ප්‍රාදේශීය කළමනාකාර මහතා අද දින ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීමට ආරාධිතයින් ලෙස කැඳවූ බවත් නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමිය පැහැදිලි කිරීමෙන් අනතුරුව සාකච්ඡාව ආරම්භ කරන ලදී.

3.5.1 රක්ෂිත සීමාව තුල ගොවීන් සිටුවා ඇති තේක්ක ගස් එම ගොවීන්ට කපා ගැනීමට අවස්ථාව ලබා දිය හැකිද යන්නත් දැවමය වටිනාකමක් නැති ගස් ගොවි සංවිධාන වලට ඉවත් කර ගැනීමට අවසර දිය හැකිද යන්නත් ගොවි සංවිධාන නිලධාරින් විමසූ අතර ඉතිරි ශ්‍රම දින 20 තුල මෙම ගස් හා අතු ඉති ඉවත් කර ගැනීමට ඉක්මන් ක්‍රමවේදයක් අවශ්‍ය බවත් සහභාගිව සිටි සියළුම ගොවි සංවිධාන නිලධාරින් විසින් පෙන්වා දෙන ලදී.

3.5.2 අඩවි වන නිලධාරි එච්.ජේ.එම්.ජේ. හේරත් මහතා - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව - අනුරාධපුර

වාරිමාර්ග රක්ෂිත සීමාව තුල තිබෙන ගස් වුවත් නිසි ක්‍රමවේදයකින් තොරව ගොවීන් විසින් ඉවත් කළහොත් විවිධ අක්‍රමිකතා සිදු විය හැකි බැවින් දැවමය වටිනාකමක් නොමැති ගස් වුවද නොකැපිය යුතු බවට බීට්ටු වන නිලධාරි මහතා දී ඇති තීරණය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුව නිවැරදි බවත් මෙහිදී ක්‍රියාත්මක වන ජීවන සහන වැඩසටහන තුලින් මෙම ගස් ඉවත් කර ගැනිම සඳහා විනිවිද භාවයකින් යුක්තව ගැටළු ඇති නොවන පරිදි ක්‍රමවේදයක් සකස් කර ගත යුතු බවත් දැනටමත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේද සහභාගිත්වය ඇතුව එක් එක් ඇල මට්ටමින් ඉවත් කර ගත යුතු ගස් පිළිබඳව ලේඛනය සකස් කර තිබීම පහසුවක් බවත් ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය යටතේ ලබා දෙන ඉවත් කළ යුතු ගස් ලේඛනයට අනුව දැව සංස්ථාව හරහා එම ගස් ඉවත් කර ගැනිමට අවශ්‍ය සහයෝගය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ලබා දෙන බවත් දැනුම් දෙන ලදී.

3.5.3. නියෝජ්‍ය ප්‍රාදේශීය කළමනාකරු කේ.පී.බී.එස්. රත්නසේකර මහතා - රාජ්‍ය දැව සංස්ථාව - අනුරාධපුර

ඇල මට්ටමින් හඳුනාගෙන ඇති ඉවත් කළ යුතු ගස් ලේඛනය ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව දැව සංස්ථාව වෙත ලබා දෙන ලෙසත් එය ලැබුණු වහාම ක්ෂේත්‍ර පරික්ෂාවක් තුලින් ඉදිරි කටයුතු කඩිනමින් සලසා දිය හැකි බවත් ආර්ථිකමය වටිනාකමක් සහිත ගස් දැව සංස්ථාව ලබා ගන්නා බවත් ආර්ථිකමය වටිනාකමක් නැති ගස් ගොවි සංවිධාන මට්ටමින් ඉවත් කර ගැනීමට අවසර ලබා දිය හැකි බවත් එවැනි ගස් දර ලෙස යොදා ගැනීමට බලාපොරොත්තු වනවා නම් සහනදායි මිලක් යටතේ එම දර ලබා දිය හැකි බවත් ප්‍රවාහනය සඳහා බලපත්‍රයක් ගොවි සංවිධානයට ලබා දිය හැකි බවත්

වාරිමාර්ග රක්ෂිත සීමාව තුල ගොවීන් විසින් තේක්ක ගස් සිටුවා තිබේ නම් අදාල ගොවියාගේ ඉල්ලීම මත ප්‍රාදේශීය ලේකම් එම ඉල්ලීම අනුමත කර තිබේ නම් අදාල ගොවියාටම එම ගස් ඉවත් කර ගැනීමට දිය හැකි බවත්

දැව සංස්ථාව විසින් ලබා ගන්නේ දැවමය වටිනාකමක් සහිත කොටස් පමණක් බැවින් අතුඉති වැනි ශේෂ කොටස් ගොවි සංවිධාන මට්ටමින් ඉවත් කර ගත යුතු බවත් ඇල මාර්ගයන්හි ජලය ගෙන යාමට බාධාවක් නොවන පරිදි එම අතු ඉති දැව සංස්ථාව විසින් ඇල ඉවුරෙන් එපිටට දමන බවත් ගස් ඉවත් කර ගැනීමේදී ගොවි සංවිධාන වල හා අදාල රාජ්‍ය ආයතනවල සහයෝගය අවශ්‍ය බවත් දැනුම් දෙන ලදී. ඒ අනුව එක් එක් ඇල මට්ටමින් ඉවත් කළ යුතු බවට හඳුනාගෙන ඇති ගස් ලේඛනය ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය යටතේ දිස්ත්‍රික් වන

කම්ටුවේ ආවරණය අනුමැතිය යටත්ව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවවටද පිටපතක් සහිතව යොමු කර දීමෙන් අනතුරුව ඉහත පරිදි අවශ්‍ය කටයුතු සලසා දිය හැකි බව දැනුම් දෙන ලදී.

04 වාරිමාර්ග මෙහෙයුම් හා නඩත්තු කටයුතු :- ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු පී.යු.කේ. තිලකරත්න මහතා

4.1 වැව් බැම්මේ ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් වැවේ ජල මට්ටම අඩු කළ අතර 2016/08/04 දිනට ජාලාශයේ ජල මට්ටම අඩි 1 අඟල් 2 (අක්කර අඩි 2900) බවත්

4.2 වැව් බැම්මේ පුනරුත්ථාපන කටයුතු වල භෞතික ප්‍රගතිය 30% පමණ බවත් දැනට

- රළපනාවේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර පෙරහනය ඉදිකිරීම් කටයුතුද ආරම්භ කර ඇත.(පෙරහනය 70% අවසන්ය)
- වාන් දොරටු දෙකෙහි නඩත්තු කටයුතු අවසන් කර ඇත.
- සම්බන්ධිත මාර්ගයේ (link Road) බොරළු අතුරා සකස් කර ඇත.
- දකුණු ඉවුර පිවිසුම් මාර්ගය කොන්ක්‍රීට් යොදා ඉදිකිරීම් කටයුතු සිදු කර ඇත. (70% අවසන්ය) වම් ඉවුර පිවිසුම් මාර්ගය කොන්ක්‍රීට් යොදා ඉදිකිරීම් කටයුතු සිදු කර ඇත.(90% අවසන්ය)

4.3 ජීවන සහන වැඩසටහන

ගොවි සංවිධාන 14 හි බෙදුම් ඇල හා කෙත් ඇල මාර්ග ශුද්ධ කිරිමේ කටයුතු 90% පමණ අවසන් බවත් ප්‍රධාන ඇල පද්ධතිය ශුද්ධ කිරිමේ කටයුතු කළ යුතුව පවතින බවත් ජීවන සහන සහන වැඩසටහනේ මිනිස් ශ්‍රමය ඇස්තමේන්තු කර ඇත්තේ ප්‍රධාන ඇල ද ඇතුලත් වන පරිදි බැවින් ප්‍රධාන ඇල ශුද්ධ කිරිමේ කටයුතුද ගොවි සංවිධාන විසින් කළ යුතු බවත් කැලය ශුද්ධ කිරීම යටතේ වාරිමාර්ග නිර්මිත වලට හා ජලය ගැලීමට බාධාවන ගස් ඉවත් කර ගැනීම ඉදිරි වැඩමුර 2 තුල කරගත යුතු බවත් ජීවන සහන වැඩසටහන යටතේ යන්ත්‍ර යොදවා කර ගැනීමට තිබෙන කාර්යයන් සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මැෂින් යුනිට් එක සෑම ගොවි සංවිධානයකටම දින 02 බැගින් ලබා දීමට සැලසුම් කර ඇති බවත් එහිදී අවශ්‍ය ට්‍රැක්ටර් ගොවි සංවිධාන විසින් සපයා ගත යුතු බවත්

රක්ෂිත කණු සකස් කිරිමට අවශ්‍ය අමුද්‍රව්‍ය අගෝස්තු 05 හෝ 06 ගොවි සංවිධාන නම් කළ ස්ථානවලට ලබා දිය හැකි බවත් ඒ අනුව ගොවි සංවිධාන විසින් රක්ෂිත කණු සකස් කර ගත යුතු බවත් කණු සකස් කිරීමට අවශ්‍ය අච්චු සඳහා ලැලිද ඉල්ලීම් පරිදි ලබා දිය හැකි බවත් දැනුම් දෙන ලදී.

4.4 ගොවි සංවිධාන මට්ටමින් ඉදිරිපත් කරන ලද ගැටළු

| අනු අංකය | ඉදිරිපත් කළ අය | කාරණය | විසඳුම |
|---|---|---|---|
| 4.4.1 | ගරු සභාපති ව.ඉ. මිහිඳු ගොවි සංවිධානය | A9 මාර්ගයේ සිට (ගංගාරාමය අසල) ගොවි සංවිධාන බල ප්‍රදේශයට සම්බන්ධ වන කෘෂි මාර්ගය සකස් කර දෙන ලෙස ඉල්ලීම | ක්ෂේත්‍ර පරික්ෂාවක් කිරීමට තීරණය විය |
| 4.4.2 | ගරු සභාපති ද.ඉ.වේළුසුමන ගොවි සංවිධානය | OT 10, OT 13ඇල වල්වල රොන් මඩ ඉවත් කිරීම සඳහා අවශ්‍ය ලෙවල් ලබා දෙන ලෙස ඉල්ලීම | ඒ සඳහා 2016/08/19 දින යොදා ගැනීමට තීරණය විය. |
| 4.4.3 | ගරු සභාපති ව.ඉ.සුහද ගොවි සංවිධානය | කබරගොයාවැව වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතට ගැනීමට කටයුතු කරන ලෙසට ඉල්ලීම | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිර්දේශය ඊට අවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| | | | බව |
| **4.4.4** | ගරු සභාපති ඒකාබද්ධ ගොවි සංවිධානය | සියලුම ගොවි සංවිධාන අගෝස්තු මාසයේ දින 10 ප්‍රධාන ඇල ශුද්ධ කිරිම කළ යුතු බවත් ප්‍රධාන ඇලේ රක්ෂිත සීමාව දක්වාම ශුද්ධ කළ යුතු බවත් එහිදී ඇලෙන් එහා අඩි 33 සීමාව කැලය වැඩි බැවින් යන්ත්‍ර යොදා ශුද්ධ කිරිමට කටයුතු යෙදීම සුදුසු බවත් වැඩ සටහනේ අවසන් දින 10 ඇල වල්වල රොන් මඩ ඉවත් කිරිමට යොදා ගන්නා ලෙස ඉල්ලීමක් කරන ලදී | ප්‍රධාන ඇල ශුද්ධ කිරිම ඇස්තමේන්තු කර ඇත්තේ මිනිස් ශ්‍රමය සඳහා පමණක් බැවින් යන්ත්‍ර යොදවා ශුද්ධ කිරිම නොහැකි බව වා.ඉ. මහතා පැහැදිලි කරන ලදී |
| **4.4.5.** | ගරු භාණ්ඩාගාරික ද.ඉ. සමගි ගොවි සංවිධානය | 2013 වර්ෂයට අදාලව ලැබිය යුතු අතරුදවුම් මුදල් නොලැබිම පිළිබද | මේ සම්බන්ධ සියලු විස්තර කලාප වාරිමාර්ග කාර්යාලයට යවා ඇති බවත් වසර 2කට වඩා වැඩි මුදල් රාජ්‍ය භාණ්ඩාගාරයට යවන බවත් නැවත ගෙන්වා ගෙන ලබා දිමට කටයුතු කරන බව වා.ඉ. මහතා දැනුම් දෙන ලදී. |

**05** කෘෂිකර්ම සංවර්ධන කටයුතු - මුලස්ථාන කෘෂිකර්ම උපදේශක ඒ.ජී.එස්.සුභාෂණී මහත්මිය

**5.1** මිරිස් වගාව සඳහා විසුරුම් ජල සම්පාදන පද්ධති යොදා ගැනීම පිළිබදව ගොවින් දැනුවත් කිරිමේ පුහුණු වැඩසටහන් රඹෑව ගොවිජන සේවා මධ්‍යස්ථානයේදී පැවැත් වු බවත් විසුරුම් පද්ධති 07ක් සඳහා ගොවි මහතුන් මුදල් ලබා දී ඇති බවත්

**5.2** වැසි ආවරණ හා වගා ළිං ඉදිකිරිමේ කටයුතු අදාල ගොවි මහත්ම,මහත්මින් සිදු කරමින් සිටින බවත්

**5.3** මුල්තැන්ගෙය ක්‍රමවත් කිරිමේ පුහුණු, කාබනික පොහොර නිෂ්පාදනය මිරිස් වගාව, මිරිස් වගාවේ රෝග පළිබෝධ පිළිබඳ ආදී පුහුණු වැඩසටහන් මෙම මාසය තුල පැවැත්වීමට තුළ සිදු කිරිමට අපේක්ෂිත බවත් දැනුම් දෙන ලදී.

**06** යෙදවුම් හා සේවා සැපයීම් කටයුතු

**6.1** රඹෑව ගොවිජන සංවර්ධන නිලධාරි වසන්ත කුමාර මහතා කථාකරමින්
2016 පොහොර වැඩසටහන සඳහා ඉල්ලුම් කළ සියලු ගොවීන්ට තම බැංකු ගිණුම් වලට මුදල් ලැබිමට කටයුතු යොදා ඇති බවත්
මුදල් නොලැබුණු ගොවින්ගේ තොරතුරු පොහොර ලේකම් කාර්යාලයට යවා ඇති බවත්
අභියාචනා ඉදිරිපත් කිරිමට ඇති ගොවින්ට එම අභියාචනා හැකි ඉක්මනින් ලබා දෙන ලෙසත්
ගොඩ ඉඩම් වල ක්ෂේත්‍ර බෝග සඳහා පොහොර ඉල්ලුම් පත්‍ර ගොවීන්ට ලබා දීමට කටයුතු කර ඇති බවත් 2016 යල සඳහා පොහොර මුදල් ලබා නොගත් ගොවීන්ට පමණක් එම ඉල්ලුම් පත්‍ර නිකුත් කරන බවත්
පොල් වගාව සඳහා ඉල්ලුම් පත්‍ර කෘ.ප.නි.ස මහතුන් හරහා ගොවින්ට ලබා දිමට කටයුතු කර ඇති බවත්
2016 සැප්තැම්බර් 15 දිනෙන් ඉල්ලුම් පත්‍ර භාර ගැනීම අවසන් කරන බවත් ජාතික ආහාර නිෂ්පාදන වැඩ සටහන යටතේ ක්‍රියාත්මක ගෙවතු වගා වැඩ සටහන සඳහා ගම්මානයකින්

ගොවින් 20 දෙනෙකු බැගින් තෝරා එම නාම ලේඛණයට අනුව අදාල පුහුණු වැඩසටහන් පැවැත්වීම සිදු කරන බවත් දැනුම් දෙන ලදී.

6.2 කල්ලංචිය ගොවිජන සේවා මධ්‍යස්ථානය නියෝජනය කරමින් සංවර්ධන නිලධාරි ඒ.ඒ.යු.එස්.එන්.හේවාගමගේ මහත්මිය කථා කරමින්

2016 යල සහනාධාර පොහොර වැඩ සටහන 100% මේ වන විට සාර්ථකව අවසන් කර ඇති බවත්

කාබනික පොහොර නිෂ්පාදනය වැඩි කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත්

පොල් පැල අවශ්‍ය ගොවින්ගේ නාම ලේඛණයක් කෘ.ප.නි.ස. මගින් ලබාගෙන ඇති අතර ඒ අතර ඒ පැල හැකි ඉක්මනින් ලබා දීමට කටයුතු කරමින් පවතින බවත්

ගොවි බැංකු ණය අයවිම ඉහල මට්ටමක පවතින අතර ගොවීන් 25 දෙනෙකුගෙන් ණය අයවිමට ඇති බවත්

මේ වන විට තුලාන් මට්ටමෙන් සමීක්ෂණයක් පවත්වන අතර එය (ආහාර,වාරි,ගෙවතු,පොහොර සහනාධාරය සම්බන්ධයෙන්) මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින බවත් දැනුම් දෙන ලදී.

6.3 ගොවි සංවිධාන නිලධාරින් අදහස් දැක්වීම

ද.ඉ. මහසෙන් ගොවි සංවිධානයේ ගරු සභාපති මහතා කතා කරමින් ගොඩ ඉඩම් සඳහා පොහොර සහනාධාරය ලබා දෙනවාද යන්න විමසන ලදී. ඒ සඳහා පිළිතුරු ලබා දුන් රඹෑව ගොවිජන සංවර්ධන නිලධාරි මහතා ඊට අදාල චක්‍ර ලේඛ තවම ලැබි නැති බවත් චක්‍ර ලේඛ ලැබුණු පසු නිසි පිළිතුරක් ලබා දෙන බවත් දැනුම් දෙන ලදී.

07 ඉඩම් සංවර්ධන කටයුතු

7.1 රඹෑව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය නියෝජනය කරමින් ජනපද නිලධාරි ජී.කේ.එම්.යු.එස්.කේ. කවිරාජ් මහතා කතා කරමින්

ජනපදය තුළ මුලික ඉඩම් පරික්ෂණ කටයුතු අවසන් කර ඇති බවත්

ඉඩම් කච්චේරි සඳහා ක්ෂේත්‍ර පරික්ෂණ කිරිමට නියමිත බවත්

වර්ෂයේ ඉලක්කගත සියලුම දීමනා පත්‍ර සකස් කර නියෝජ්‍ය ඉඩම් කාර්යාලය වෙත භාර දී ඇති බවත්

පළාත් සභා ඉඩම් කොටස් වල මුලික ඉඩම් පරික්ෂණයක් 2016/08/12 දින සේවා පියස වහමල්ගොල්ලෑවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇති බව දැනුම් දෙන ලදී.

ඉහත කරුණු සාකච්ඡා කිරිමෙන් අනතුරුව ප.ව. 2.30 ට පමණ නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමියගේ ස්තුති කථාවෙන් පසු රැස්විමේ කටයුතු අවසන් කෙරිනි.

මීලඟ ව්‍යාපාර කළමනාකරන කමිටු රැස්වීම 2016 සැප්තැම්බර් 01 දින පැවැත්වේ.

Mathirani

……………………
**I.D.N.I. පතිරණ**
නේවාසික ව්‍යාපාර කළමනාකරු
මහකනදරාව ව්‍යාපාරය
රඹෑව.

<u>පිටපත්</u>

- ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය, කොළඹ
  - කා. දැ.ගැ.ස
- අධ්‍යක්ෂ, වාරිමාර්ග කළමණාකරණ අංශය,කොළඹ
  - කා. දැ.ගැ.ස
- දිස්ත්‍රික් ලේකම්, අනුරාධපුර
  - කා. දැ.ගැ.ස
- වාරිමාර්ග අධ්‍යක්ෂ, අනුරාධපුර
  - කා. දැ.ගැ.ස
- අධ්‍යක්ෂ, ජල කළමණාකරණ අංශය වාරිමාර්ග දෙපාර්තමේන්තුව,කොළඹ
  - කා. දැ.ගැ.ස
- නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අ/ප), අනුරාධපුර
  - කා. දැ.ගැ.ස
- ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්, අනුරාධපුර
  - කා. දැ.ගැ.ස
- ප්‍රාදේශීය ලේකම් රඹෑව/මිහින්තලය
  - කා. දැ.ගැ.ස
- ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු, අනුරාධපුර
  - කා. දැ.ගැ.ස

මගේ අංකය :- **16/03/02**

නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය

මහකනදරාව ව්‍යාපාරය

රඹෑව.

**2017.01.18**

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ සියළුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

<u>ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව **2017** ජනවාරි මාසය</u>

<u>මහකනදරාව ව්‍යාපාරය</u>

දිනය - **2017.01.05**

වේලාව - **පෙ.ව.9.30**

ස්ථානය - මහකනදරාව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාව

සහභාගී වූ රජයේ නිලධාරින්

| අනු අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 01 | අයි.ඩී.එන්.අයි.පතිරණ මිය | නේවාසික ව්‍යාපාර කළමනාකරු | මහකනදරාව ව්‍යාපාරය |
| 02 | බී.ටී. මහආරච්චි මයා | ඉංජිනේරු සහකාර | වාරි.ඉංජිනේරු කාර්යාලය, අනුරාධපුර |
| 03 | සි .එස්.චන්ද්‍රසේකර මිය | ගොවිජන සංවර්ධන නිලධාරි | ගොවිජන සේවා මධ්‍යස්ථානය - මිහින්තලය |
| 04 | යු.ආර්.ජී.වසන්ත කුමාර මයා | ගොවිජන සංවර්ධන නිලධාරි | ගොවිජන සේවා මධ්‍යස්ථානය -රඹෑව |
| 05 | යු.ජී.ඒ.එස්. ආරියරත්න මයා | සංවර්ධන නිලධාරි | මහකනදරාව ව්‍යාපාරය |
| 06 | ජී.කේ.එම්.යු.එස්.කේ. කවිරාජ් මයා | ජනපද නිලධාරි | ප්‍රදේශීය ලේකම් කාර්යාලය -රඹෑව |
| 07 | යු.බී. හේරත් බංඩා මයා | ජනපද නිලධාරි | ප්‍රදේශීය ලේකම් කාර්යාලය -රඹෑව |
| 08 | ආර්.පී.ප්‍රනාන්දු මයා | කෘෂිකර්ම උපදේශක | ගොවිජන සේවා මධ්‍යස්ථානය -රඹෑව |

සහභාගි වූ ගොවි නියෝජිතයින්

| අනු අංකය | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 01 | ආර්.එම්.ආර්. රාජපක්ෂ මයා | ගරු සභාපති | ව.ඉ. සුහද ගොවි සංවිධානය |
| 02 | ඩී.බී. දිසානායක මයා | ගරු සභාපති | ද.ඉ. රණමයුර ගොවි සංවිධානය |
| 03 | යසපාල සෙනවිරත්න මයා | ගරු ලේකම් | ද.ඉ. සමගි ගොවි සංවිධානය |
| 04 | එම් ප්‍රේමරත්න මයා | ගරු සභාපති | ද.ඉ. පැරකුම් යාය 05 ගොවි සංවිධානය |
| 05 | එස්.එම්.කේ.බී.සමරකෝන් මයා | ගරු භාණ්ඩාගාරික | ව.ඉ. මිහිදු ගොවි සංවිධානය |
| 06 | ඒ.එම්.විජේතුංග | ගරු සභාපති | ව.ඉ. මිහිදු ගොවි සංවිධානය |
| 07 | එල්.එම්. කපිලසේන මයා | ගරු භාණ්ඩාගාරික | ව.ඉ. සුහද ගොවි සංවිධානය |
| 08 | එච්.කිර්තිපාල මයා | ගරු උප ලේකම් | ව.ඉ. රඹෑවගම ගොවි සංවිධානය |
| 09 | එස්.ටී.බී.සුභසිංහ මයා | ගරු සභාපති | ව.ඉ. රඹෑවගම ගොවි සංවිධානය |
| 10 | ආර්.පී.සරණපාල මයා | ගරු ලේකම් | ව.ඉ. මිහිදු ගොවි සංවිධානය |
| 11 | ඩබ්.එන්.පී.විමල් රත්නසිරි මයා | ගරු භාණ්ඩාගාරික | ද.ඉ. සමගි ගොවි සංවිධානය |
| 12 | ඩබ්.ඩී.එල්.ගුණසේකර මයා | ගරු භාණ්ඩාගාරික | ව.ඉ. මහසෙන් ගොවි සංවිධානය |
| 13 | ඒ.එම්.එන්. මීරාන් මයා | ගරු ලේකම් | ද.ඉ. ෂම් ෂම් ගොවි සංවිධානය |
| 14 | කේ.එම්.ආර්.සී.බණ්ඩාර මයා | ගරු ලේකම් | ද.ඉ. මහසෙන් ගොවි සංවිධානය |
| 15 | සුභසිංහ රත්නායක මයා | ගරු සභාපති | ව.ඉ. රණමයුර ගොවි සංවිධානය |
| 16 | එස්. ඩී.සුනිල් මයා | ගරු ලේකම් | ද.ඉ. පැරකුම් යාය 05 ගොවි සංවිධානය |
| 17 | ආර්.ඒ.ඒ. රාජපක්ෂ මයා | ගරු සභාපති | ද.ඉ. සමගි ගොවි සංවිධානය |
| 18 | ඩී.එම්. ලීල් හේරත් මයා | ගරු සභාපති | ද.ඉ. පැරකුම් යාය 02ගොවි සංවිධානය |
| 19 | ජී.ධර්මපාල මයා | ගරු ලේකම් | ව.ඉ. එක්සිත් ගොවි සංවිධානය |
| 20 | එස්.එම්. විමල් සමරනායක මයා | ගරු සභාපති | ව.ඉ. මහසෙන් ගොවි සංවිධානය |
| 21 | බී.විජේසිංහ මයා | ගරු සභාපති | ද.ඉ. රණමයුර ගොවි සංවිධානය |
| 22 | අයි.එම්. ජයතිස්ස මයා | ගරු සභාපති | ද.ඉ. සුහද ගොවි සංවිධානය |

ආගම සිහි කිරීමෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමිය විසින් 2017 නව වසර සඳහා සුබ පතමින් පැමිණී සිටි සියළු දෙනා පිළිගැනීමෙන් පසුව රැස්වීමේ න්‍යාය පත්‍රය සභාගත කරන ලදී.

**01.** පසුගිය රැස්වීම් වාර්තාව සමාලෝචනය හා එකගතාවය ලබා ගැනිම.
පසුගිය වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූ බැවින් දකුණු ඉවුර පැරකුම් යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපති මහතාගේ හා ව.ඉ. එක්සිත් ගොවි සංවිධානයේ ගරු ලේකම් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

**02.** ලිපි ඉදිරිපත් කිරිම.

| අනු අංකය | නිකුත් කළ අය/ආයතනය | කාරණය | වෙනත් |
|---|---|---|---|
| **2.1** | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | වාර්ෂික සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිපාදන පිළිබඳ දැනුවත් කිරීම. | කමිටු සමාජිකයන් දැනුවත් කරන ලදී. |
| **2.2** | ප්‍රාදේශීය ලේකම්, රඹෑව | මහකනදරාව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ පැවැත්විමට අපේක්ෂිත පිරිත් දේශනය පිළිබඳ සාකච්ඡාවට සහභාගිවන ලෙස දැනුම් දීම. | **2017** ජනවාරි **06** වන දින පෙ.ව. **10.00**ට පැවැත්වෙන සාකච්ඡාව සඳහා සහභාගි වන ලෙසට සියළුම ගොවි සංවිධාන නිලධාරින් දැනුවත් කරන ලදී. |
| **2.3** | ගරු සභපති ව.ඉ. රඹෑවගම ගොවි සංවිධානය | රඹෑව වැව යටතේ සිදු කර ඇති වී වගාව සඳහා (අක්කර **105**) ජලය ලබා දෙන ලෙස ඉල්ලීම | රඹෑව වැව මහකනදරාව ව්‍යාපාරයට අයත් අන්තර් වැවක් බැවින් රඹෑවගම ගොවි සංවිධානයට පමණක් ජලය නිකුත් කලහොත් ව.ඉ. සුහද හා ව.ඉ. ඉවුර එක්සිත් ගොවි සංවිධාන වල ජල ඉල්ලීම් සඳහාද ජලය නිකුත් කල යුතු බවත් තිබෙන ජල මට්ටම අනුව එසේ ජලය නිකුත් කළ නොහැකි බවත් මෙම ඉල්ලීම **2016/17** මහ කන්න රැස්වීම් තීරණ වලට පටහැනි බවත් අනෙකුත් ගොවි සංවිධාන නිලධාරින් විසින් පෙන්වා දෙමින් සිටියදී ආවේගශිලි ලෙස කථාකරමින් රඹෑවගම ගොවි සංවිධානයේ ගරු සභාපති රැස්වීමෙන් මහතා පිටව ගිය අතර එවන් තත්වයක් තුලදී රඹෑවගමට ජලය නිකුත් කිරීම නුසුදුසු බවට අනෙකුත් ගොවි සංවිධාන නිලධාරින් විසින් ඒකමතිකව තීරණය කරන ලදී. |
| **2.4** | ව.ඉ. එකමුතු ගොවි සංවිධනයේ ගොවීන් පිරිසක් | වම් ඉවුර **OT01/ OT02** හා **OT04** ඇල මාර්ග යටතේ වගා කර ඇති (අක්කර **29 1/2** ) වී වගාව සඳහා ජලය ලබා දෙන ලෙස ඉල්ලීම | වගා කර ඇත්තේ අගාවත කොටස් වල වීමත් එසේම ව.ඉ. රණමයුර හා ව.ඉ. මිහිඳු ගොවි සංවිධාන බල ප්‍රදේශ යටතේද අගාවත් වල වී වගාව කර ඇති බැවින් එම ගොවීන්ගෙන්ද ජලය ඉල්ලීම් තිබෙන බැවින් සහ යම් හෙයකින් ජලය නිකුත් කලද එයින් වැඩිපුරම සිදු වන්නේ ජලය නාස්ති වීමත් බැවින් ව.ඉ.එකමුතු ගොවි සංවිධානයේ ඉල්ලීමද ප්‍රතික්ෂේප කෙරිනි. |

**03.** ආයතන සංවර්ධන කටයුතු :- නේවාසික ව්‍යාපාර කළමනාකරු - මහකනදරාව ව්‍යාපාරය

3.1 2017 වර්ෂයේ මහකනදරාව ව්‍යාපාරයේ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම අනුව වර්ෂය තුල අවධානය යොමු කළ යුතුව පවතින විශේෂ වැඩසටහන් පිලිබඳව පැහැදිලි කළ අතර එහිදී වස විස නැති ගොවිතැනට යොමු වීම සඳහා කාබනික පොහොර නිෂ්පාදනය හා ග්ලිරිසීඩියා වගාවට යොමු වීම පිළිබඳවද ගොවි සංවිධාන නිලධාරින් දැනුවත් කරන ලදී.

3.1.1 වාරිමාර්ග කළමනාකරණ අංශය විසින් ලබාදුන් උපදෙස් පරිදි 2017 වර්ෂය තුල සියළුම ගොවි සංවිධාන වල පැවැත්වීමට නියමිත නිලවරණ 2017 මැයි හා ජුනි යන මාස 02 තුල පැවැත්වීමට අපේක්ෂිත බවද පැහැදිලි කළ අතර සියළුම ගොවි සංවිධාන නිලධාරින් එයට එකඟතාවය පළකරන ලදී.

3.1.2 මහකනදරාව ජලාශයේ බැම්ම පුනරුත්ථාපනය කිරීම හේතුවෙන් 2016 යල කන්නය අතහැරීමට සිදු වූ අතර 2016/17 මහ කන්නයේ වගාවට යොමුවීමට ප්‍රමාණවත් ජල ධාරිතාවයක් ජලාශයේ නොමැති බැවින් අසරණභාවයට මුහුණ දී සිටින මහකනදරාව ව්‍යාපාරයේ ගොවි ජනතාව සඳහා cash for work වැඩසටහනක් ක්‍රියාත්මක කර දෙන ලෙසට වාරිමාර්ග කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂතුමිය වෙත ඉල්ලීමක් කළ බවත්

3.1.3 2017 ජනවාරි 11 දින ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඇලහැර විද්‍යාලීය ක්‍රීඩාංගණයේදී පැවැත්වෙන ඉහල ඇල හැර ඇල ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවයේ ජනහමුව සඳහා මහකනදරාව ව්‍යාපාරයේ ගොවීන් කණ්ඩායමක් සහභාගි කරවන ලෙසට ඉල්ලීමක් කර ඇති බැවින් ඒ පිළිබඳව ගොවි සංවිධාන නිලධාරින් දැනුවත් කරන ලදී.

3.1.4 පවතින වියළි කාලගුණය පහව ගොස් වර්ෂාව ලැබේවා යන්න සහ ජනතාවට සෙත් පැතීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සියළුම රාජ්‍ය ආයතන වල සහයෝගයෙන් ජය ශ්‍රී මහ බෝ සමිඳුන් අභියදී සති පිරිත් දේශනයක් 2017 ජනවාරි 04 සිට ජනවාරි 11 දක්වා පැවැත්වෙන බවත් ඒ සඳහා මහකනදරාව ව්‍යාපාරයේ ගොවි මහත්ම මහත්මීන්ද (50 දෙනෙකු පමණ) පිරිත් ශ්‍රවණය හා පිරිත් මංඩපයේ අවතේව කටයුතු සඳහා 2017 ජනවාරි 07 දින පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා සහභාගි විය යුතු බවත් දැනුම් දෙන ලදී.

3.1.5 "ආර්ථිකයට සවියක් හා රක්ෂිතයට ආරක්ෂාවක් " අරමුණු කරගෙන ඉල්ලුම් කළ පුවක් පැළ වලින් මේ වන විට පැළ 5200ක් ලැබී ඇති බවත් එම පුවක් පැල සිටුවීමේදී පවතින නියඟ තත්වය යටතේ පැළය රැක බලාගැනීමේ වගකීම යටතේ ගොඩ ඉඩම් සීමාව තුල සිටුවීමට පමණක් ගොවීන් වෙත පැළ බෙදා දීමේදී ගොවි සංවිධාන විසින් කටයුතු කල යුතු බවත් පැහැදිලි කරන ලදි.

3.1.6 2016 දෙසැම්බර් මස ප්‍රගතිය - සංවර්ධන නිලධාරි යූ.ජී.ඒ.එස්. ආරියරත්න මයා

| අනු අංකය | කාරණය | ප්‍රගතිය | වෙනත් |
|---|---|---|---|
| 3.1.6.1 | කාරක සභා රැස්වීම් පැවැත්වීම | 09 | ද.ඉ. පැරකුම් යාය 02, ද.ඉ. රණමයුර, ද.ඉ.සුහද, ව.ඉ. මහසෙන්, ව.ඉ. එක්සිත් ගොවි සංවිධාන රැස්වීම් පවත්වා නැත. |
| 3.1.6.2 | මහ සභා රැස්වීම් පැවැත්වීම | 02 | ද.ඉ. මහසෙන් - 2016/12/30 හා ව.ඉ. එක්සිත් 2016/12/10 දින පවත්වන ලදී. |
| 3.1.6.3 | 2016 දෙසැම්බර් මස මාසික මුදල් සාරංශ කාර්යාලයට ලබා ගැනීම (2017 - 01 - 05 දිනට) | 02 | ද.ඉ. සමගි, ව.ඉ. මිහිඳු ගොවි සංවිධාන පමණක් ලබා දී ඇත. |

3.1.8 2017 වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම අනුව ජනවාරි මාසය තුල පහත ඉලක්ක සපුරාගත යුතුව පවතින බවත්

3.1.8.1 ගොවි සංවිධාන 08ක 2016 වර්ෂයේ ගිණුම් විගණණය කළයුතු අතර 2017/01/17 දින ගිණුම් විගණණය සඳහා කටයුතු යොදා ඇති බවත්

3.1.8.2 නිලවරණ මහ සභා රැස්වීම් පැවැත්වීම.

2017 ජනවාරි සිට ජුනි දක්වා පැවැත්විමට නියමිත ගොවි සංවිධාන 07 හි නිලවරණ 2017 ජුනි මාසය තුලත් ජුනි සිට දෙසැම්බර් දක්වා පැවැත්වීමට නියමිත ගොවි සංවිධාන 06 හි නිලවරණ ජූලි මාසය තුලත් පැවැත්වීමට අපේක්ෂිත බවත්

3.1.8.3 සමාජික නාම ලේඛණ යථාවත් කිරිම

ගොවි සංවිධාන 08ක සාමාජික නාම ලේඛණ යථාවත් කළ යුතුව පවතින බවත්

3.1.8.4 වැසිඅපේක්ෂාවෙන් අනුරාධපුර ජය ශ්‍රී මහ බෝ සමිඳුන් අභියස පවත්වන වැහි පිරිත් දේශනය ශ්‍රවණය සඳහා 2017/01/07 දින ගොවි සංවිධාන මට්ටමින් සහභාගිවිම පිළිබඳ දැනුවත් කරන ලදී.

3.1.8.5 පුවක් වගාව ව්‍යාප්ත කිරිම උදෙසා පුවක් පැළ ලබා දිමේ වැඩසටහන යටතේ ද.ඉ. මහසෙන් පුවක් පැළ 1000, ව.ඉ. එකමුතු පුවක් පැළ 1000, ව.ඉ. රණමයුර පුවක් පැළ 1000,ව.ඉ. මිහිඳු පුවක් පැළ 1500,ව.ඉ. එක්සිත් පුවක් පැළ 700 ක් වශයෙන් පැළ ලබා දි ඇති බවත් අනෙකුත් ගොවි සංවිධාන සඳහා ඉදිරි කාලය තුළ පැළ ලබාදිමට නියමිත බවත් දැනුම් දෙන ලදි.

04 වාරිමාර්ග මෙහෙයුම් හා නඩත්තු කටයුතු :- ඉංජිනේරු සහකාර බී.ටී.මහආරච්චි මහතා

4.1 අද දිනට ජලාශයේ ජල මට්ටම :- අඩි 4 අඟල් 11 (ධාරිතාවය අක්කර අඩි 5900) ක් බවත්

4.1.1 මහ කන්නය සඳහා අපේක්ෂිත වර්ෂාව මේ වන විටත් ලැබි නොමැති බැවින් කන්නය පිළිබඳ බලාපොරොත්තු රහිත තත්ත්වයන් නිර්මාණය වෙමින් පවතින බවත්

4.2. වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය

4.2.1 වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ අපේක්ෂා කළ වැඩ කොටස් වලින් 95% - 98% පමණ නිම කර ඇති බවත් සැතපුම් කණු දැමීම හා රක්ෂිත සීමාව වෙන් කිරිමට ඇති බවත්

4.2.2 වැව් බැම්මේ ඉදිකිරීම් කටයුතු කල කොන්ත්‍රත්කරු විසින් එහි වැඩකටයුතු නිම කිරීමෙන් අනතුරුව 2016/12/31 දින මහකනදරාව වැවේ දේවාලය අසලදී කිරි ඉතිරවීමක් සිදු කල බවත්

4.2.3 වැව් බැම්මේ සිදු කර ඇති ඉදිකිරිම් කටයුතු පිළිබඳව නිරීක්ෂණය කරන ලෙසට ගොවි සංවිධාන නිලධාරීන් වෙත විවෘත ආරාධනයක්ද කරන ලදි.

4.3 ගොවි සංවිධාන මටමින් ඉදිරිපත් කළ වාරි පද්ධතියේ ගැටළු

| අනු අංකය | ඉදිරිපත් කළ අය | කාරණය | වෙනත් |
|---|---|---|---|
| 4.4.1 | ගරු සභාපති ද.ඉ. පැරකුම් යාය 02/ ගරු සභාපති ද.ඉ. පැරකුම් යාය 05/ ගරු භාණ්ඩාගාරික ද.ඉ. සමගි | වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ නඩත්තු අරමුදල් යටතේ සිදු කල නඩත්තු වැඩ පිළිබඳව සාකච්ඡා කිරිමට සියළුම පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් රැස්වීමක් කැඳවා දෙන ලෙස ඉල්ලීම | එම ඉල්ලිම ද.ඉ. රණමයුර ගොවි සංවිධානයේ ගරු ලේකම් මහතා විසින් ස්ථිර කරන ලදී. |

05. කෘෂි කාර්මික සංවර්ධන කටයුතු :- කෘෂිකර්ම උපදේශක ආර්.පී.ප්‍රනාන්දු මහතා
5.1 සෝයා බෝංචි වගාව හඳුන්වා දිම සඳහා 25Kg ප්‍රමාණයක් (2.5 Kg බැගින් පැකට් 10 ක්) බෙදා දීම සිදු කල බවත්
5.2 වගා ලිං ආශ්‍රිතව සිටුවීම සඳහා ඉදිරියේ දි මුං බීජ නොමිලයේ ලබා දීමට අපේක්ෂිත බවත්
5.3 ලැබුණු ඉල්ලීම් අනුව විසුරුම් ජල සම්පාදන පද්ධති කීපයක් ක්ෂේත්‍රයේ සවි කරමින් පවතින බවත්

5.4 50% දායකත්වය යටතේ (ගල්කිරියාගම) මිරිස් බීජ (MICH3) ප්‍රභේදය සුළු ප්‍රමාණයක් ගොවීන් අතර බෙදා දුන් බවත්

5.5 එලවළු තවාන් තැටි 50% දායකත්වය යටතේ ලබා දිය හැකි බවත්

5.6 මේ වන විට පළතුරු ගම්මාන 16 ක් හා ගෙවතු ගම්මාන 26ක් ස්ථාපිත කර ඇති බවත් දැනුම් දෙන ලදී.

06 යෙදවුම් හා සේවා සැපයුම් කටයුතු

6.1 මිහින්තලය ගොවිජන සංවර්ධන නිලධාරි සී.එස්. චන්ද්‍රසේකර මහත්මිය.

6.1.1 කාන්තා ගෙවතු වගා වැඩ සටහන සඳහා ගුණාත්මක පැල ලබා දීම පිළිබඳව අන්තර් පළාත් කෘෂිකර්ම උපදේශක තුමියට ස්තුතිය පුද කරන බවත්

6.1.2 2016/17 මහ කන්නය සඳහා පොහොර සඳහා මුදල් නිකුත් කරන ලද්දේ සත්‍ය වශයෙන්ම වගා කර ඇති ඉඩම් සඳහා පමණක් බවත් මහකනදරාව ව්‍යාපාරයට අයත් මිහින්තලය ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් ගොවි සංවිධාන 2 සඳහා 2016 යල් කන්නයට පොහොර මුදල් නිකුත් කර ඇති හෙයින් මෙම කන්නය සඳහා පොහොර මුදලක් ගෙවීම සිදු නොකරන බවත් එමෙන්ම වගාව සිදු නොවූ බැවින් කිසිසේත්ම පොහොර මුදල් නොගෙවන බවත්

6.1.3 2017 වර්ෂය සඳහා අක්කර බදු අයකර ගැනීමේදී අදාල තුලාන භාර කෘ.ප.නි.ස නිලධාරිවරයාට ගොවි සංවිධාන මට්ටමින් අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙසත්.

6.1.4 පවතින නියං කාලගුණික තත්ත්වය මත විපතට පත්වන ගොවි ජනතාව පිළිබඳ පිළිබඳව ලබා දිය හැකි සේවා සැපයුම් පිළිබඳව සාකච්ඡා කරමින් පවතින බවත් අමාත්‍යාංශ මට්ටමින් ඉදිරියේදි ගන්නා ලද තිරණ අනුව ක්‍රියාකිරීමට නියමිත බවත් දැනුම් දෙන ලදී.

6.2 රඹෑව ගොවිජන සංවර්ධන නිලධාරි වසන්ත කුමාර මහතා

6.2.1 2016/17 මහ කන්නය සඳහා පොහොර වෙනුවට මුදල් ලබා දිමේ වැඩසටහන
මහ කන්නය සඳහා වගාවන් සිදු කළ ඉඩම් ප්‍රමාණයට පමණක් එම ගොවීන් සඳහා ඔවුන්ගේ ගිනුම් වලට මුදල් ලැබිමට සලස්වා ඇති බවත්

6.2.2 ගෙවතු වගා වැඩසටහන
එක් ගම්මානයකට ගෙවිලියන්ගෙන් සැදුම් ලත් එක් ගොවි සංවිධානයක් බැගින් පිහිටුවා අවශ්‍ය පුහුණු වැඩසටහන් පවත්වා ඇති බවත් ඒ අනුව ගෙවිලියන්ගේ ගොවි සංවිධාන 35ක් පිහිටුවා ඇති බවත් ඒ සඳහා එක් ගෙවිලියකට පැළ වර්ග 6 බැගින් හා බිජ පැකට් කට්ටල් 01 බැගින් ලබා දි ඇති බවත්

6.2.2.2 පළතුරු ගම්මාන වැඩසටහන
තුලානකට එක බැගින් පළතුරු ගම්මාන 18 ක් පිහිටුවා ඇති බවත් අවශ්‍ය පලතුරු පැළ එම ගොවින්ට දී ඇති බවත්

6.2.3 ගොවිජන බැංකු කටයුතු
2016/17 මහ කන්නය සඳහා ගොවීන් 30කට රු.5000 බැගින් ණය ලබා දිය හැකි බවත්ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත්
ණය නොගෙවන ගොවින් සඳහා ගොවිජන විනිශ්චය සභාවට යොමු කර අවශ්‍ය නීතිමය කටයුතු සිදු කරන බවත් දැනුම් දෙන ලදී.

6.3 ගොවි සංවිධාන මට්ටමින් ඉදිරිපත්කළ ගැටළු

| අනු අංකය | ඉදිරිපත් කළ අය | කාරණය | වෙනත් |
|---|---|---|---|
| 6.3.1 | ගරු ලේකම් ව.ඉ. මිහිඳු ගොවි සංවිධානය | පළතුරු ගම්මාන වැඩසටහනට 2017 සඳහාද අළුතින් සාමාජිකයන් බඳවා ගන්නේදැයි විමසීම. | 2016 වර්ෂය සඳහා මේ වන විට කණ්ඩායම් බඳවා ගෙන ඇති බවත් 2017 වසර සඳහා නව බඳවා ගැනීම් සිදු කිරිමට අනුමැතියක් ලැබුනහොත් දැනුම් දෙන බවත් රඹෑව ගොවිජන සංවර්ධන නිලධාරි මහතා පවසන ලදී. |
| 6.3.2 | ගරු සභාපති ද.ඉ. පැරකුම් යාය 02 ගොවි සංවිධානය | කල්ලංචිය ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් අංක 93 තුලානේ රාජකාරි කටයුතු | ඒ පිළිබඳව කල්ලංචිය ගොවිජන සංවර්ධන නිලධාරි දැනුවත් කිරීමට තිරණය විය. |

| | | | |
|---|---|---|---|
| | | සම්බන්ධව ගොවි ජනතාව කනස්සල්ල එල කරන බව දැනුම් දෙන ලදී. | |
| **6.3.3** | ගරු සභාපති ද.ඉ. මහසෙන් ගොවි සංවිධානය | බඩ ඉරිගු වගාව සඳහා ලබාදෙන පොහොර සහනාධාරය ප්‍රමාද වීම පිළිබඳ | අදාල අයදුම් පත්‍ර අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇති බව දැනුම් දෙන ලදී. |

**07** ඉඩම්සංවර්ධන කටයුතු :-

**7.1** රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනපද නිලධාරි ජී.කේ.එම්.යු.එස්.කේ.කවිරාජ් මහතා 2016 වර්ෂයේ ප්‍රගතිය ඉදිරිපත් කරමින්

**7.1.1** දිමනා පත්‍ර 21 ක් සකස් කර ඇති බවත්

**7.1.2** ඉඩම් කච්චේරි 06 ක් පවත්වා ඇති බවත් (බලපත්‍ර 3157 )සකස් කර ඇති බවත්

**7.1.3** දිර්ඝ කාලීන බදු බල පත්‍ර 72 ක් සකස් කර ඇති බවත්

**7.1.4** දිර්ඝ කාලීන බදු බලපත්‍ර සඳහා මැණුම් ඉල්ලීම් 40 ක් යොමු කර ඇති බවත්

**7.1.5** වෙනත් අවශ්‍යතා සඳහා මැණුම් ඉල්ලීම් 32ක් යොමු කර ඇති බවත්

**7.1.6** පසු උරුමය නම් කිරීම් 50ක් සිදු කර ඇති බවත්

**7.1.7** මුල් උරුම නම් කිරීම් 33 ක් සිදු කර ඇති බවත්

**7.1.8** ඉඩම් බැහැර කිරීම් 33 ක් සිදු කර ඇති බවත්

**7.1.9** ඉඩම් ආරවුල් විසදීම් 21 ක් සිදු කර ඇති බවත්

**7.1.10** සන්තකය ආපසු ගැනීමේ පනත යටතේ නඩු පැවරීම් 02ක් සිදු කර ඇති බවත්

**7.1.11** 2017 වර්ෂය සඳහා ඉඩම් සංවර්ධන කටයුතු කඩිනමින් හා කාර්යක්ෂමව සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් දැනුම් දෙන ලදී.

ඉහත කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව ප.ව.1.30 ට පමණ නේවසික ව්‍යාපාර කළමනාකාරතුමියගේ ස්තුති කථාවෙන් පසු රැස්වීමේ කටයුතු අවසන් කෙරිනි.

මීලඟ ව්‍යාපාර කලමනාකරණ කමිටු රැස්වීම 2017 පෙබරවාරි 02 දින පැවැත්වේ.

..............................

I.D.N.I. පතිරණ

නේවාසික ව්‍යාපාර කළමනාකරු

මහකනදරාව ව්‍යාපාරය

රඹෑව.

<u>පිටපත්</u>

- ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය,කොළඹ -
  කා.දැ.ගැ.ස
- අධ්‍යක්ෂ, වාරිමාර්ග කළමනාකරණ අංශය, කොළඹ -
  කා.දැ.ගැ.ස
- දිස්ත්‍රික් ලේකම්, අනුරාධපුර -
  කා.දැ.ගැ.ස
- වාරිමාර්ග අධ්‍යක්ෂ, අනුරාධපුර -
  කා.දැ.ගැ.ස
- අධ්‍යක්ෂ,ජල කළමනාකරණ අංශය වාරිමාර්ග දෙපාර්තමේන්තුව,කොළඹ -
  කා.දැ.ගැ.ස
- නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අ/ප), අනුරාධපුර -
  කා.දැ.ගැ.ස

- ❖ ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්,අනුරාධපුර -
  කා.දැ.ගැ.ස
- ❖ ප්‍රාදේශීය ලේකම් රඹෑව/මිහින්තලය -
  කා.දැ.ගැ.ස
- ❖ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු, අනුරාධපුර -
  කා.දැ.ගැ.ස